

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - **79**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය බදුල්ල

පාර්ලිමේන්තුවේ රජයේ ඟිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 79

மாவட்ட செயலகம் - பதுளை

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் நிறுவன பொறுப்பு கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No – 79

District Secretariat – Badulla

Submission of observation of Hon. Minister in charge of the institutions and steps taken with regards to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119 (4)

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග 119 (4) සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය බදුල්ල.

රා.ගි.කා. සභාව විසින් හඳුනා ගන්නා ලද දුර්වලතා	ගණන්දීමේ නිලධාරි විසින් ගත් ක්‍රියාමාර්ග සහ වර්තමාන ප්‍රගතිය
ඇප ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	ඇප තැන්පත් නොකළ සියළුම නිලධාරීන්ගේ ඇප තැන්පත් කිරීමට කටයුතු සිදු කර ඇති අතර, ඇප තැන්පත් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු සිදු කර ඇත.
වාහන ලැයිස්තු ගත කිරීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබිණි.	වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.
ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබිණි.	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.
අනවසර අල්ලා ගැනීම් පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	අනවසර අල්ලා ගැනීම් පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත.
දීර්ඝකාලීන බලපත්‍ර නිකුත් කිරීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	දීර්ඝකාලීන බලපත්‍ර නිකුත් කිරීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත.
වියදම් උපයෝගිතා ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	වියදම් උපයෝගිතා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත.
අවධානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	අවධානම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලැබේ.
2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගනක මෘදුකාංගයට අදාල පළමුවන මුරපදය ගණකාධිකාරී හෝ අවසරලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කර නොතිබුණි.	අදාළ සියළු නිලධාරීන් දැනුවත් කර ඇත. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි.
2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගනක මෘදුකාංගයට අදාල මුරපද තුන් මසකට වරක් වෙනස් කර නොතිබුණි.	රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගනක මෘදුකාංගයට අදාල මුරපද තුන් මසකට වරක් වෙනස් කරන ලෙස අදාල නිලධාරීන් වෙත උපදෙස් ලබා දුනිමි.

විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	කාර්තුවකට වරක් පවත්වන සෑම විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදීම මේ සම්බන්ධයෙන් දැනුවත් කරන අතර, ප්‍රගති සමාලෝචනය සිදු කරයි. ප්‍රමාදය වලක්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත. විගණන විමසුම් වලට පිළිතුරු නියමිත දිනට නිවැරදිව ලබාදෙන ලෙස සියළුම ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	ප්‍රමාදය වලක්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර, විගණන විමසුම් වලට පිළිතුරු නියමිත දිනට නිවැරදිව ලබාදෙන ලෙස සියළුම ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇත.වර්තමානය වන විට නියමිත කාලයේ දී පිළිතුරු ලබා ගැනීමට කටයුතු කර ඇත.
මූ.රෙ. 134 (2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩ සටහන වර්ෂය ආරම්භයේ දී පිළියෙල කර නොතිබුණි.	මූ.රෙ. 134 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වැඩ සටහන වර්ෂය ආරම්භයේ දී පිළියෙල කරනු ලැබේ.
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විගණන කමිටු අවම ප්‍රමාණයෙන් හෝ රැස්ව නැත.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විගණන කමිටුව නියමිත ආකාරයට පවත්වා ඇත.
2017.06.26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේ දී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොමිස්ෂනේර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි.
2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මූ.රෙ. 756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මූ.රෙ. 756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය සිදුකර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත යැවීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබාදී ඇති අතර වර්තමානයේ නිවැරදි කර ඇත.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳ වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2023 වර්ෂයේ අතිරික්ත ඌනතා නිවැරදිව හඳුනාගෙන අදාළ කාලරාමුව තුළ නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.
සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහනවල අයිතිය තහවුරු කිරීමේ ලේඛන ඇත.
සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	සියළුම සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට කටයුතු කර ඇත.
වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි.	මේ වන විට 250-2069 හා 250-2075 අංක දරණ කැබ් රථ අපහරණය කර අවසන් අතර තවත් වාහන 02 ක් අපහරණය සඳහා කටයුතු කරමින් පවතියි.

රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මූ.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මූ.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇති අතර, මේ වන විට ඒ සඳහා කටයුතු සිදුකර ගෙන යනු ලැබේ.
නියමිත දිනයට බැංකු සැසඳුම් පිළියෙළ කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට සකස් කර යැවීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. එමෙන්ම 2024 වර්ෂයේ සිට නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ යැවීමට කටයුතු කර ඇත.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	මෙම හිඟ ණය ශේෂ වලින් පළාත් සභා නිලධාරීන්ට අදාල ණය ශේෂ නිරවුල් කිරීම සම්බන්ධයෙන් පළාත් සභාව දැනුවත් කර ඇත. අනෙකුත් ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු සිදු කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. මේ වන විට 2022 වර්ෂයේ තිබුණු හිඟ ණය ශේෂයෙන් රු. 1,246,154.00 ක මුදලක් නිරවුල් වී ඇති අතර ඉතිරි රු. 420,285.57 ක මුදල නිරවුල් කිරීමට කටයුතු සිදු කර ඇත.
පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මූ.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මූ.රෙ. 571 ප්‍රකාරව කටයුතු කරන ලෙස උපදෙස් ලබාදෙන ලදී. මේ වන විට 2022 වර්ෂයේ පොදු තැන්පත් ගිණුමේ පැවති ශේෂයෙන් රු. 2,422,845.27 ක මුදලක් නිරවුල් කර ඇත. ඉතිරි මුදල වන රු. 2,769,213.79 ක මුදල නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතියි.
මූ.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්යය අතුරු අග්‍රිම කාර්යය නිමවී දින 10 ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	ඉදිරියේ දී මූ.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්යය අතුරු අග්‍රිම කාර්යය නිමවී දින 10 ක් ඇතුළත නිරවුල් කිරීමට කටයුතු කරමි.
වෙනත් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් අයකල ආදායම් නියමිත කාලය තුළ අදාළ ආයතන වෙත යවා නොතිබුණි.	වෙනත් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් අයකල ආදායම් නියමිත කාලය තුල යැවීමට කටයුතු කරමි.
මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.	සෑම මසකම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට සැලසුම් කර තිබූ නමුත් විවිධ ගැටලු එනම් සම සභාපතිවරුන්ගෙන් දින නොලැබීම හා නිලධාරීන්ගේ වෘත්තීය ක්‍රියාමාර්ග හේතුවෙන් නියමිත දිනට රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ බව පිළිගන්නා අතර, ඉදිරියේ දී මාසිකව රැස්වීම් පැවැත්වීමට කටයුතු කරමි.
දිස්ත්‍රික් ලේකම් විසින් කැඳවනු ලබන ප්‍රාදේශීය ලේකම් සමුළුව මාසිකව පවත්වා නොතිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව මාසිකව ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සමුළුව පැවැත්විය යුතු බව පිළිගනිමි . එසේ වුවත්,මේ වන විට ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීම හා ප්‍රගති

	සමාලෝචනයට අදාල පරිසර කමිටු රැස්වීම්,කෘෂිකර්ම කමිටු රැස්වීම් පැවැත්වීම සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව විවිධ සීමාවන් යටතේ සිදුකරන ලදි. තවද දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා විගණන කළමනාකරණ කමිටු රැස්වීම් අවස්ථාවලදී ද අවස්ථානුකූල උපදෙස් ලබා දීම්,විමසීම් හා සමාලෝචන පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. එසේ තිබිය දී රජයේ මුදල් ව්‍යයදම් කරමින් එකම කාරණය සඳහා නැවත නැවත කාලය වැය කරමින් රැස්වීම් කැඳවීම සිදු නොකළත් මාර්ගගත ක්‍රමය ඔස්සේ දැනුවත් කිරීම්, ප්‍රගති සමාලෝචනය කිරීම් හා විශේෂ සාකච්ඡා පැවැත්වීම බාධාවකින් තොරව සිදු කරන බව සඳහන් කරමි.
දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස්වී නොතිබුණි.	දිස්ත්‍රික් නිවාස කමිටු රැස්වීම් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් සංවිධානය කරනු ලබන අතර, එම රැස්වීම් සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් කැඳවීම් පමණක් සිදු කරනු ලැබේ.
දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස්වී නොතිබුණි.	දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස්වීම් පැවැත්වීම් සඳහා වෙන්කර දෙනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බවත්, ප්‍රාදේශීය ගොවිජන සංවර්ධන නිලධාරීන්ගේ මාසික ප්‍රගති සමාලෝචන කමිටුව පවත් වන බවත් එහිදී අදාළ දැනුවත් කිරීම් සිදුකරන බැවින් මාසිකව රැස්වීම් පැවැත්වීම අවශ්‍ය නොවන බව සඳහන් කරමි.
දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව මාසිකව රැස්වී නොතිබුණි.	සාමාන්‍ය පරිදි 2022 වර්ෂයේ මුල්භාගයට අදාළව 2021.12.29 දින දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව පවත්වා තිබුණ ද ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ HA/ED/District Projects හා 2022.03.01 දිනැති ලිපිය මඟින් එවකට සිසුයෙන් ගොඩනැඟිලි ද්‍රව්‍ය මිල ගණන් සහ ප්‍රවාහන මිල ගණන් ඉහළ ගිය බැවින්,මාසිකව මිළ කමිටුව රැස්කරන ලෙස උපදෙස් ලබාදෙන ලදී. ඒ අනුව, 2022 වර්ෂයේ අප්‍රේල්,මැයි,ජූනි මාසවල දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව පවත්වා ඇති බව සඳහන් කරමි. තවද 2022 ජූනි මාසයෙන් පසු ගොඩනැඟිලි ද්‍රව්‍ය , ප්‍රවාහන මිළ ගණන් සිස්ර ලෙස වෙනස් නොවූ බැවින්, සහ BSR ලේඛනය මාස 06 කට වරක් සකසන බැවින් ඊට අදාළ වන ලෙස නැවත සාමාන්‍ය පරිදි මාස 06 කට වරක් මිළ කමිටුව රැස් කරන ලදී.

ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	මහජනයාට පැමිණිලි සහ යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී ඇත. අරුණෝදය යනුවෙන් නව වැඩසටහනක් ද මේ වන විටත් දිස්ත්‍රික් ලේකම් කාර්යයාලීය නිල වෙබ් අඩවිය හරහා ක්‍රියාත්මක වන බව සඳහන් කරමි.
2018.01.24 දිනැති අංක 05/2018 (1) දරන චක්‍ර ලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 5/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍ර ලේඛය ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතියි.
ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිළිබඳ අධීක්ෂණය කිරීමට ක්‍රමවේදයක් සකස් කරමින් පවතියි.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අතිරේක පුහුණුවක් නියම කර නොතිබුණි.	අංක BD/GN/130/18/2022 හා 2022.06.03 දිනැති රාජ්‍ය වියදම් පාලනය සම්බන්ධව ලිපියට අනුව, වියදම් සීමා කිරීම කලයුතු බැවින්, පුහුණු වැඩසටහන් මානව සම්පත් සැලැස්මේ සඳහන් පරිදි සිදුකිරීමට නොහැකි විය. නමුත් මේ වන විට මානව සම්පත් සැලැස්මට අනුව පුහුණු වැඩසටහන් පවත්වාගෙන යන බව කාරුණිකව දන්වා සිටිමි.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගත කිරීමට කටයුතු කර ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ අභිතකර මට්ටමේ විය.	මූල්‍ය ප්‍රකාශ වලින් සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන මතයක් ලබා ගැනීම සඳහා අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී. 2022 සහ 2023 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන සඳහා තත්ත්වාගණනය කළ මතයක් ලබා දී ඇත.
සමාලෝචිත වර්ෂයේ කාර්යය සාධන ඉලක්ක නියමිත දිනට ඉදිරිපත් කර නොමැත.	ඉදිරියේ දී කාර්යය සාධන ඉලක්ක නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් කාර්තුවකට එක බැගින් රැස්වී නොතිබුණි.	දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් කාර්තුවකට එක බැගින් පැවැත්වීමට ඉදිරියේ දී කටයුතු කරමි.
2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත අනුව ආපදා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.	2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත අනුව ආපදා කළමනාකරණ කමිටු පැවැත්වීමට ඉදිරියේ දී කටයුතු කරමි.

සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	අංක BD/GN/130/18/2022 හා 2022.06.03 දිනැති රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධව ලිපියට අනුව, වියදම් සීමා කිරීම කලයුතු බැවින්, පුහුණු වැඩසටහන් මානව සම්පත් සැලැස්මේ සඳහන් පරිදි සිදුකිරීමට නොහැකි විය. නමුත් මේ වන විට මානව සම්පත් සැලැස්මට අනුව පුහුණු වැඩසටහන් පවත්වාගෙන යන බව කාරුණිකව සඳහන් කරමි.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි.
සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් සියළුම නිලධාරීන් දැනුවත් කර වත්කම් බැරකම් ප්‍රකාශ ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත.
උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරුකර යැවීමට කටයුතු කර නොතිබුණි.	වසර 05 ට වැඩි කාර්යය මණ්ඩල වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කරන ලද අතර, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් වාර්ෂික ස්ථාන මාරු මේ වන විට ක්‍රියාත්මක වන බව සඳහන් කරමි.
දිස්ත්‍රික් පරිසර කමිටුව අවම වශයෙන් මාස 02 කට වරක් රැස්වී නොතිබුණි.	2022 මැයි මස සිට 2022 සැප්තැම්බර් මස දක්වා කාලය තුල පරිසර කමිටුවේ සාකච්ඡාව සඳහා ගැටළු ඉදිරිපත් නොවීම හේතුවෙන් පරිසර කමිටුව රැස් නොවූ අතර, 2022 ඔක්තොම්බර් මස සිට මේ දක්වා නියමිත කාලයන්හි දී දිස්ත්‍රික් පරිසර හා වන ආරක්ෂණ කමිටුව පැවැත් වේ.

පණ්ඩුක ශ්‍රී ප්‍රභාත් අබේවර්ධන,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
බදුල්ල.

පණ්ඩුක ශ්‍රී ප්‍රභාත් අබේවර්ධන
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
බදුල්ල.

එච්.එම්.අනුෂා හේමමාලි මැණිකේ,
ප්‍රධාන ගණකාධිකාරි ,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
බදුල්ල.

එච්.එම්.අනුෂා හේමමාලි මැණිකේ
ප්‍රධාන ගණකාධිකාරි
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල.

ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් වෙත ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් අත්‍යවශ්‍යලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

ප්‍රදීප් යසරත්න
ලේකම්
පාදේය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ කටයුතු අංශය)
"මිහිඳු මැදුර" ඇල්විහරය මාවත, කොළඹ 05.

ප්‍රදීප් යසරත්න

ලේකම්,

පාදේය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2024 වර්ෂය තුල දී සාධනීය මට්ටම් ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන් (පා.මි.)

අග්‍රාමාත්‍යතුමා සහ

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය